# වචන භාවිතය: බෞද්ධ නිර්ණායක පිළිබඳ විමර්ශනයක්

# [Usage of Words; An Analysis of Buddhist Criteria]

**Panamure Chandima**[1]

## Abstract

The air stream that flows from the human lungs strikes various points in the mouth to produce different sounds. These sounds combine to form words. Humans exchange ideas with one another through the use of words. According to the teachings of the Buddha, it is essential to be truthful in speech. It is stated that a person becomes hollow (empty) as a result of making false statements. ("Rittan tucchan kho Rāhula, tesaṁ sāmaññaṁ yesaṁ tatthi sampajāna musāvāde lajjā" Majjhima Nikāya 2.130) Misuse of words can lead to the breakdown of society, and the Buddhist tradition emphasizes that a person who misuses speech through false speech, slander, harsh words, (musāvāda,pisunāvācā, pharusāvācā, samphappalāpā) or idle chatter is capable of committing any wrongdoing. ("Vitiṇṇa paralokassa natthi pāpaṁ akāriyaṁ" Dhammapada Pāḷi, p. 68) Accordingly, there is arguably nothing as powerful as speech in leading society toward good or evil. Therefore, this study aims to investigate the criteria used by the Buddha when using words.

**Keywords**: Buddhism, Criteria, Speech, Usage, Words

1 Senior Lecturer, Department of Buddhist and Pali Studies, Bhiksu University of Sri Lanka.
E-mail: pchandima@busl.ac.lk

### හැඳින්වීම

යමෙකු විසින් කියන දේ තේරුම් ගැනීම, නිවැරදි ව අවබෝධ කරගැනීම වැදගත් වූවකි. එසේ කර ගැනීමට භාෂාවේ වචන පිළිබඳ නිවැරදි අවබෝධය උපකාර වේ. ඇතැම් විට යමෙකුගේ යහපතට කියන දෙයක් වැරදි ලෙස අවබෝධ කර ගැනීම මහත් විනාශයක මූලය විය හැකි ය. එබැවින් තමා අසන දෙය නිවැරදි ව තේරුම් ගැනීම ඉතා වැදගත් වේ. විශේෂයෙන් සමාජයේ පවතින විවිධ ආප්තෝපදේශවලින් ද වචනයේ ඇති ප්‍රබල බව තේරුම් ගැනීමට හැකි ය. ''මාලුවා නහින්නේ කට නිසා'' යන්න එවැන්නකි. හුදෙක් ම එයින් අදහස් කරන්නේ තමා ප්‍රකාශ කරන වදන් තමාගේ විනාශයට හෝ දියුණුවට උපකාර වන්නේය යන්න යි. ''හොඳට නරකට දෙකට කට ම ය'' යන්න ද එවැනි ම ආප්තෝපදේශයකි. මෙමඟින් පැහැදිලි වන්නේ වචනය ඉතා ම ප්‍රබල අවියක් බව යි. මේ අවිය නිවැරදි ලෙස භාවිත කරන්නේ කෙසේ ද? යන්න පිළිබඳ බුද්ධ දේශනාවල ඇතුළත් වන කරුණු මෙහි දී විමර්ශනය කෙරේ.

### සාහිත්‍ය විමර්ශනය

මෙම මාතෘකාවට අදාළ ව තොරතුරු ගවේෂණය කිරීමේ දී සෘජු ව වචන පිළිබඳ කරන ලද පූර්ව පර්යේෂණ නොමැති තරම් ය. එහෙත් භාෂාව සම්බන්ධ ව ඉදිරිපත් වී ඇති ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලේඛන විශාල ප්‍රමාණයක් දැකිය හැකි ය. දේවාලේගම මේධානන්ද හිමියන් විසින් 'භාෂාව පිළිබඳ බෞද්ධ ආකල්පය' නමින් ශාස්ත්‍රීය ලිපියක් සම්පාදනය කර ඇත. එහි දී භාෂාව සම්බන්ධ විවිධ අදහස් හා බුදුදහමේ භාෂාවට ලැබෙන ප්‍රමුඛතා ආදිය සාකච්ඡා කරයි. එහෙත් භාෂාවේ එක් අංගයක් වූ වචන පිළිබඳ අධ්‍යයනයක් එහි දී සිදු වී නැත.

කොස්වත්තේ අරියවිමල හිමියන් විසින් රචනා කරන ලද විවරණ නම් ශාස්ත්‍රීය ලිපි එකතුවේ දී භාෂාව හා ඉන්ද්‍රිය ඥානය නමින් ලිපියක් ඉදිරිපත් කර ඇත. එහි දී ඉන්ද්‍රිය ඥානය ලැබීමට භාෂාව කොතෙක් දුරට උපකාරි වන්නේ ද? යන්න පිළිබඳ අවධානය යොමු කොට ඇත. ඉන්ද්‍රිය ඥානයේ දී පවා යම් යම් අවස්ථාවල දී භාෂාව යනු ඉතා ම දුර්වල සීමිත අර්ථයක් පමණක් ප්‍රකාශ කළ හැකි උපකරණයක් ලෙස එහි දී දක්වා ඇත. එහෙත් වචනය පිළිබඳ විවරණයක් හෝ එය භාවිත කළ යුතු පිළිවෙළ පිළිබඳ විවරණයක් එහි ඇතුළත් නො වේ.

ඇකිරියගල නන්ද හිමියන්ගේ බෞද්ධ අධ්‍යයන ප්‍රවේශය නම් කෘතියේ දී ද භාෂාව සම්බන්ධ බෞද්ධ ආකල්පය පැහැදිලි කර තිබේ. එහෙත් වචනවල ප්‍රබලත්වය හෝ එහි වටිනාකම් පිළිබඳ අදහසක් දක්වා නැත.

ඔලිවර් අබේනායක පාලි අධ්‍යයන විමර්ශන නම් ග්‍රන්ථයේ දී භාෂාව සම්බන්ධ බෞද්ධ ස්ථාවරය පැහැදිලි කර ඇත. එහෙත් වචනවල තීව්‍රතාව හෝ ඒවා භාවිත කළ යුත්තේ කෙසේ ද? යන්න පිළිබඳ අදහසක් දක්වා නැත.

සාහිත්‍යමය වශයෙන් වචනවල භාවිතාව පිළිබඳ සෘජු පර්යේෂණ මෙතෙක් සිදු වී තිබෙන්නේ වාග්විද්‍යා ක්ෂේත්‍රයෙනි. බෞද්ධ අදහස සම්බන්ධ විශේෂ අවධානයන් පර්යේෂණයේ දී සොයා ගැනීම දුෂ්කර විය. එහෙත් පූර්ව පර්යේෂණය ද උපයෝගි කර ගනිමින් සූත්‍ර පිටකයේ විවිධ දේශනාවලට මූලිකත්වය ලබා දෙමින් මෙම පර්යේෂණය සිදු කෙරේ.

### පර්යේෂණ ක්‍රමවේදය

මානව ශාස්ත්‍ර පිළිබඳ සිදු කෙරෙන මෙම පර්යේෂණය මඟින් සිදු කරන්නේ ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය මූලික කොටගෙන ය. ඊට අමතර ව මේ පිළිබඳ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ සාකච්ඡා කොට තොරතුරු ලබා ගන්නා ලදි.

**පර්යේෂණයේ අරමුණු**

මූලික වශයෙන් මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කරන්නේ වචනවල ඇති ප්‍රබලතා මොනවා ද එමඟින් සමාජයට ඇති බලපෑම කුමක් ද? යන්න විමසීම වන අතර බුදුරජාණන් වහන්සේ වචන උපයෝගි කරන ලද්දේ කුමන අරමුණකින් ද හා වචන භාවිතයේ දී බුදුරජාණන් වහන්සේ යොදා ගනු ලබන ක්‍රමවේද නිර්ණායක මොනවා ද? යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වෙයි.

**පර්යේෂණ ගැටලුව**

වචන භාවිත කිරීමේ දී බුදුරජාණන් වහන්සේ යොදාගත් නිර්ණායක තිබේ ද? යන්න හා ඒවායේ ස්වභාවය කෙබඳු ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි.

**සාකච්ඡාව**

වචන පවසන ආකාරය කෙසේ විය යුතු ද? යන්න විවිධ සූත්‍රවල දක්වා ඇත. මජ්ඣිම නිකායේ සන්දක සූත්‍රයේ වචන පවසන ආකාර පහක් දක්වා ඇත. යම් කෙනෙක් පවසද්දී අසන්නා මෛත්‍රී සහගත සිතින් යුක්ත විය යුතු බව ද එහි දක්වා ඇත.

1. කාලයෙහි හෝ අකාලයෙහි පවසන වදන් (කාලෙන වා අකාලෙන වා)
2. සත්‍යයෙන් හෝ අසත්‍යයෙන් පවසන වදන් (භූතෙන වා අභූතෙන වා)
3. මෘදුව හෝ රළු අයුරින් පවසන වදන් (සණ්හෙන වා ඵරුසෙන වා)
4. අර්ථාන්විත ව හෝ අනර්ථාන්විත ව පවසන වදන් (අත්ථසංහිතෙන වා අනත්ථ සංහිතෙන වා)
5. මෛත්‍රී සිතින් හෝ ද්වේෂ සිතින් පවසන වදන් (මෙත්තා චිත්තා වා දොසන්තරා වා) (මජ්ඣිම නිකාය I,- 318 පිටුව)

මෙහි පස් ආකාර වූ වචන ඇසෙන කල හැසිරිය යුතු ආකාරය ද එම සූත්‍රයේ දක්වා ඇත.

''න චෙව නො චිත්තං විපරිණතං භවිස්සති. න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාම. හිතානුකම්පි ච විහරිස්සාම මෙත්තා චිත්තා න දොසන්තරා තඤ්ච පුග්ගලං මෙත්තා සහගතෙන චෙතසා ඵරිත්වා විහරිස්සාම තදාරම්මණං ච සබ්බාවන්තං ලොකං මෙත්තා සහගතෙන චිත්තෙන විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරිස්සාමාති. එවං හි බො භික්ඛවෙ සික්ඛිතබ්බං (මජ්ඣිම නිකාය I,- 318 පිටුව).

මෙහි අදහස වන්නේ ''අපගේ සිත නොපෙරලෙවා, ලාමක වචන නොකියන්නෙමු. අනුකම්පාවෙන් යුක්ත ව මෛත්‍රී සහගත සිත් ඇති ව නොකිපුණු සිත් ඇති ව වාසය කරන්නෙමු. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රී සිත පතුරුවා වාසය කරන්නෙමු. මුළු ලෝකය ම ඒ මෛත්‍රී චිත්තයාගෙන් අරමුණු කොට මහත් බවට ගියා වූ වෛර නැත්තාවූ ද්වේශ නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් යුක්ත ව හික්මිය යුතු ය (මජ්ඣිම නිකාය I, 318 පිටුව). එසේ හික්මවිය යුතු ආකාරය පිළිබඳ වන සතරාකාර උපමාවක් ද උක්ත සූත්‍රයෙහි දක්වා ඇත.

යම් පුද්ගලයෙකු උදැල්ලක් රැගෙන විත් මේ මහපොළොව මම නොපොළොවක් කරමියි කොටන්නේ ද'' පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාල පිටකං ආදාය සො එවං වදෙය්‍ය අහං ඉමං මහාපඨවිං අපඨවිං කරිස්සාමි (මජ්ඣිම නිකාය I, 318 පිටුව). මහපොළොව කිසිසේත් ම කම්පා නො වේ. එය කරන්නා දැඩි වෙහෙසට ලක්වනවා පමණි. එසේ ම යමෙක් මහපොළොවට කෙළ, සෙම්, සොටු, මළ, මූත්‍රා දමන්නේ ද?, පොළොව ඒ සියල්ලක් ම සම සිතින් දරාගනී. එසේ ම තමා වෙත පැමිණෙන සියලු සැප දුක සම සිතින් දරාගත යුතු ය.

යම් පුද්ගලයෙකු ''මම නිල් හෝ රතු හෝ යම් පැහැයකින් යුතු පාටවලින් අහස පාට කරන්නෙමි. චිත්‍ර කරන්නෙමි. අහං ඉමස්මිං ආකාසෙ රූපං ලිඛිස්සාමි, රූප පාතුභාවං කරිස්සාමි (මජ්ඣිම නිකාය I, 318 පිටුව). යැයි සිතා චිත්‍ර අඳින්නේ ද කිසි කලෙක එය සපල නො වේ. එසේ ම පුද්ගලයා ද අහස මෙන් දුර්වර්ණ විවර්ණ නොවී සම සිතින් සියල්ල දරාගත යුතු ය.

යම් පුද්ගලයෙකු දල්වාගත් තණ සුලක් ගෙන ''මම මේ ගංගාව ම රත් කරන්නෙමි. පුච්චන්නෙමි'' අහං ඉමාය ආදිත්තාය තිණුක්කාය ගංගා නදිං සන්තාපෙස්සාමි (මජ්ඣිම නිකාය I, 318 පිටුව). යැයි එසේ කිරීමට තැත් කළ ද එය පිරිසිදු නො වේ. එලෙස ගංගාව මෙන් දුක සැප සියල්ල සම සේ දරමින් විසිය යුතු ය.

බළල් හමින් කරන ලද මල්ල ඉතා සිනිඳු වූවකි. එය රළු කිරීමට යමෙක් වෙරදරන්නේ ද ''අහං ඉමං බිළාරභස්තං මද්දිතං සුමුද්දිතං සුපරිමද්දිතං. මුදුකං තූලිනිං ඡින්නසස්සරං ඡින්නභබ්බරං කට්ඨෙන වා කඨලෙන වා සරසරං කරිස්සාමි භරභාරං කරිස්සාමි (මජ්ඣිම නිකාය I, 318 පිටුව). එය කළ හැකි නො වේ. වෙහෙස පමණි. එසේ ම එම බළල් හම සහිත මල්ල සේ පුද්ගලයා ද කිසි අයුරකින් රළු බවක් කෝප බවක් ඇති නොකරගෙන විසිය යුතු ය.

මෙම විස්තරයෙන් පැහැදිලි වන්නේ වචන නිසා සිදු විය හැකි අවස්ථාවන්වල දී හැසිරිය යුතු ආකාරය යි.

වචනයේ භාවිතය පිළිබඳ බෞද්ධ උපදේශ පිළිබඳ සාකච්ඡා කිරීමේ දී මජ්ඣිමනිකායේ අභය රාජකුමාර සූත්‍රය ඉතා වැදගත් වෙයි.

නිගණ්ඨ නාථ පුත්ත ශාස්තෘවරයාගේ උපදෙස් මත අභයරාජ කුමාරයා බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ ඍජු ව ම උන් වහන්සේගෙන් ප්‍රශ්න නොකොට පසුදින දානය සඳහා තම නිවසට වැඩමකරන ලෙස ආරාධනා කරයි. ඒ අනුව බුදුරජාණන් වහන්සේ අභයරාජ කුමරුගේ මන්දිරයට වැඩම කළහ. දන් වළඳා අවසන් වූ පසු අභයරාජ කුමාරයා බුදුන් වහන්සේගෙන් විමසන්නේ ''ඔබ වහන්සේ අනුන්ගේ හිත් රිදවන අප්‍රිය හා අමනාප දෑ පවසන්නේ ද යන්න යි. එය එකවර පිළිතුරු දිය නොහැකි මෙන් ම විස්තර වශයෙන් පිළිතුරු ලබාදිය යුතු වූවක් බවට බුදුන් වහන්සේ විසින් සඳහන් කරන ලද අතර තමන් ප්‍රශ්න අසන්නේ නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයාගේ උපදෙස් මත බව අභයරාජ කුමාරයා පවසයි.

මේ අවස්ථාවේ දී අපූරු සිදුවීමක් සිදු වෙයි. අභයරාජ කුමාරයාගේ පුත්‍රයා පැමිණ ඔහුගේ උකුළමත හිඳගනී. එම අවස්ථාව මනාව උපයෝගි කරගත් බුදුරජාණන් වහන්සේ ඔහුගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන්හ. රාජ කුමාරයාණෙනි ඔබගේ දරුවා ගල් කැටයක් හෝ කටුවක් උගුරේ හිරකරගතහොත් ඔබ කුමක් කරන්නේ හි ද? එම පැනයට පිළිතුරු දෙන අභයරාජ කුමරු ස්වාමීනි මම දරුවා පැත්තකට හරවා උගුරට ඇඟිල්ලක් දමා ඇඟිල්ල නමා කෙසේ හෝ ගල්කැටය එළියට ගන්නෙමි. එවිට බුදුරජාණන් වහන්සේ විමසනුයේ එසේ කිරීමට හේතුව කිම දැයි විමසනුයේ දරුවා කෙරෙහි ඇති ආදරය නිසා බව අභයරාජ කුමාරු පැවසී ය.

එය උපමා කොටගත් බුදුරජාණන් වහන්සේ අන් අයගේ යහපත පිණිස වචන භාවිතයෙහි උපයෝගිතාව පෙන්වා දෙමින් ලොව පවතින සත්‍ය හයක් අතුරින් දෙකක් පමණක් තමන් වහන්සේ භාවිතයට ගන්නා බව පැවසූහ.

1. යම් වචනයක් සිදු නොවන්නක් (අභූත) මාළුවෙකු අහසෙහි පියාඹුවේ ය, යැයි දැක්වුවහොත් එය සිදු නොවන්නකි. එවැනි ප්‍රකාශ ''අභූත වන අතර එය ''භූත'' වනුයේ කුරුල්ලෙකු අහසෙහි

පියැඹුවේ යැයි දැක්වීමෙනි. සත්‍ය නොවූ අවැඩ ගෙන දෙන්නක් යැයි දනී ද? ඒ වචනය අනුන්ට අප්‍රිය වේ ද? අමනාප වේ ද? බුදුරජාණන් වහන්සේ එවැනි වචනය නො කියති.

2. යම් වචනයක් සිදුවන (භූත) සත්‍ය වූ අවැඩ ගෙන දෙන්නක් ය යැයි දනියි ද? ඒ වචනය ද අනුන්ට අප්‍රිය අමනාප වේ ද? බුදුරජාණන් වහන්සේ එබඳු වචනය ද නො කියති.

3. යම් වචනයක් වනාහි විය හැකි (භූත) සත්‍ය වූ අර්ථ පිණිස පවතින්නක් ය යැයි දනියි ද? ඒ වචනය ද අනුන්ට අප්‍රිය අමනාප වේ ද? බුදුන් වහන්සේ වචනය ප්‍රකාශ කිරීමෙහි කල් දමන්නේ වෙති.

4. යම් වචනයක් විය නොහැකි (අභූත) අසත්‍ය අවැඩ ගෙනදෙන්නක් ය යැයි දනියි ද? ඒ වචනය අනුන්ට ප්‍රිය මනාප වේ ද?, බුදුරජාණන් වහන්සේ එබඳු වචනය ද නො කියති.

5. යම් වචනයක් වනාහි විය හැකි (භූත) සත්‍ය අවැඩ ගෙන දෙන්නක් යැයි දනී ද? ඒ වචනය අනුන්ට ප්‍රිය මනාප වේ ද? බුදුරජාණන් වහන්සේ එබඳු වචන ද නො කියති.

6. තථාගත තෙම යම් වචනයක් වනාහි විය හැකි භූත සත්‍ය වැඩ ගෙනදෙන්නක් යැයි දනී ද? බුදුරජාණන් වහන්සේ එබදු වචන ප්‍රකාශ කිරීමෙහි කල් දමන්නේ වෙති (මජ්ඣිම නිකාය II, 96 පිටුව).

මෙම තොරතුරුවලින් වඩාත් අවධාරණය වන කාරණාව නම් කෙතරම් සත්‍යයක් වුව ද එහි වටිනාකම පවතිනුයේ එය අන් අයට ප්‍රිය හෝ මනාප වීමේ නො ව එම සත්‍යයෙන් පුද්ගලයෙකුට සිදුවන්නා වූ යහපත මත ය. ප්‍රියමනාප වචනවලින් වංචා සහගත ලෙස කටයුතු කිරීමේ හැකියාව ද පවතී. යමෙකුට යහපත සැලසීම පිණිස ප්‍රිය හෝ මනාප වචන නොව අප්‍රිය හා අමනාප වචන ද භාවිත කිරීමට සිදු වේ. අවසානයේ එම වචනයෙන් සිදු වන්නේ යහපතක් නම් එය අන් අයට අප්‍රිය හා අමනාප වුව ද ගැටලුවක් නො වේ. චේතනා පාරිදෘෂ්ටකත්වය හා ප්‍රායෝගික ප්‍රතිඵලයෙහි සුවිශේෂතාව ප්‍රධාන වන බව ඉන් ගම්‍යමාන වේ. තවෙකෙකුට යහපත සිදු වන්නා වූ වචනයක් වුව සුදුසු අවස්ථාවේ දී ප්‍රකාශ කිරීමෙහි ප්‍රායෝගික උපයෝගිතාව පැහැදිලි වනුයේ සය ආකාර වචන භාවිතයේ බුදුන් වහන්සේ විසින් භාවිත කරනු ලබන ආකාර දෙක කල් දැන ප්‍රකාශ කරන වගට (කාලඤ්ඤූ) දැක්වීමෙනි.

බුදුරජාණන් වහන්සේ සතු ව පැවති අප්‍රමාණ කරුණාව පදනම් කොටගෙන සසර දුක් විඳින සත්වයාට යහපත සැලසීම ඒකායන අරමුණ වූ බැවින් වචනයෙහි ඉලක්කය සැමවිට ම යහපත කේන්ද්‍ර වූවකි. ඒ අයුරින් වචන භාවිතය මනුෂ්‍ය ජීවිතයක් ගත කරන ඕනෑම කෙනෙකුට වටිනාකමක් එක් කරන බව පෙන්වා දිය හැකි ය. ඒ අනුව බුදුන් වහන්සේ විසින් දක්වන ලද මෙම න්‍යාය බුදුදහමෙහි වචන භාවිතය පිළිබඳ වැදගත් නිදසුනකි.

වචන භාවිතය පිළිබඳ සාකච්ඡාවේ දී තවත් වැදගත් සූත්‍රයක් ලෙස මජ්ඣිමනිකායේ කකචූපම සූත්‍රය සැලකිය හැකි ය. ''කකච'' යනු කියත යි. කියත උපමාකොට ගෙන දේශනා කරන ලද සූත්‍රය කකචූපම සූත්‍රය යි. මෝලියඵග්ගුණ නම් භික්ෂුවක් පිළිබඳ විස්තරයක් බුදුන් වහන්සේට දැන ගැනීමට ලැබේ. එනම් මෝලියඵග්ගුණ භික්ෂුව භික්ෂුණීන් වහන්සේලා සමඟ බොහෝ වේලාවක් සල්ලාපයේ යෙදෙන බවත් යම් භික්ෂුණියකගේ අගුණක් කියූ විට අනෙකුත් භික්ෂුණීන් සමඟ අඬදබර කරන බවත් ය. එය සැබෑවක් දැයි විමසූ විට 'එසේ ය'. යනුවෙන් පිළිතුරු ලබාදුන් බවත් ශ්‍රද්ධාවෙන් පැවිදි වූවෙකුට එසේ කළ නොහැකි බවත් උන් වහන්සේගේ හැසිරීම

අනුමත කළ නොහැකි බව ද යමෙකු විසින් හිරිහැර කරන කල්හි හෝ අගුණ කියන කල්හි හෝ හිරිහැරයකට ලක්වන කල්හි භික්ෂුව විසින් සිත පෙරලා නොගෙන වාසය කළ යුතු බවත් පෙන්වා දුන්හ.

වචන භාවිතය සම්බන්ධයෙන් සූත්‍රයේ ඇතුළත් කතා පුවතට අනුව වේදෙහිකා නම් කාන්තාවක් ඉතා හොඳ කීර්තියකින් යුතු ව වාසය කළා ය. ''ඇය ප්‍රිය වචන කියන්නීය. උඩගු නොවූ හා සංසුන් සිත් ඇත්තීය (මජ්ඣිම නිකාය I, 314 පිටුව). ඇයගේ නිවසේ සිටි සේවිකාව කාලි නම් වූවා ය. ඇය මෙසේ සිතුවා ය. මාගේ ආර්යාව තමා තුළ ඇත්තා වූ කෝපය පහළ නොකරන්නී ද? කෝපය නැති නිසා ම කෝප නොගන්නී ද? නැතහොත් මා සියලු කටයුතු මැනවින් සිදු කර දෙන නිසා කෝප නොගන්නී ද? කියා පරීක්ෂා කළ යුතු ය. යනුවෙන් සිතුවා ය. ඒ අනුව ඊට පසුදින ඇය දහවල් වනතුරු ම නිදා ගත්තා ය. වේදෙහිකා සේවිකාව සමීපයට පැමිණ කුමක් නිසා නිදා ගන්නේ දැයි ඇසුවා ය. කිසිවක් නැත නිකමට නිදාගත් බව සේවිකාව පැවසුවා ය. දෙවන දින ද මෙසේ ම කළා ය. එදින වේදෙහිකා නපුරු වචන කියා ඇයට නින්දා කළා ය. තෙවන දිනයේ දී ද කාලි එය ම කළා ය. එදින දොරපොල්ල ගත් වේදෙහිකාව සේවිකාවගේ හිසට පහරක් ගැසී ය ''කුපිතා අනත්තමනා අග්ගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං දස්සති'' (මජ්ඣිම නිකාය I, 316 පිටුව).

හිස පැලුනේ ය. පැලුණු හිසින් යුත් දාසිය වේදෙහිකාවගේ ප්‍රිය වචන ඇති ආකාරය බලව් උඩගු නොවූ තැනැත්තියගේ ක්‍රියාව බලව් සන්සුන් තැනැත්තියගේ ක්‍රියාව බලව් යැයි කියමින් ගම වටා ඇවිද්දා ය. මේ නිසා වේදෙහිකාව නපුරු වචන කියන දරුණු තැනැත්තියක් ලෙස ප්‍රකට වූවා ය.

මෙලෙස ම මේ ශාසනයෙහි යම් භික්ෂුවක් ඔහුට අමනාප වූ වචන අසන්නට නොලැබේ ද ඒතාක් ඉතා යහපත් වෙයි. ඉතා යහපත් පැවතුම් ඇත්තේ වෙයි. ඉතා සංසුන් ඉරියව් ඇත්තේ වෙයි. එම භික්ෂුව හට අමනාප වූ වචන අසන්නට ලැබේ ද? එවිට පවා පෙරමෙන් යහපත් පැවතුම් ඇත් ද? සංසුන් වෙත් ද? එම භික්ෂුව ශාන්ත භික්ෂුවක් බව බුදුන් වහන්සේ දෙසූහ. එසේ ම යම් භික්ෂුවක් සිව්පසය නො අඩුව ලබන්නේ ද එකල එම භික්ෂුව සුවච නො වේ. සිව්පසය නොලැබූ කල්හි ද සුවචව වාසය කරයි නම් එම භික්ෂුව යහපත් වේ. එබැවින් භික්ෂුව ධර්මය ම ගරු කරමින් ධර්මය ම පුදමින් සුවච වියයුතු බව උගන්වා ඇත. කෝප ගැනීමට අවස්ථා නොලැබෙන තැන්වල පවතින සංවරභාවය නොව කෝප ගැනීමට අවස්ථා සැලසෙද් දී ඒ තත්ත්වයට නොවැටී සිටීම සැබෑ සංවරතාව බව මෙම සූත්‍රයෙන් මැනවින් පැහැදිලි කර ඇත.

වචනයෙහි ප්‍රබලතාව ඉස්මතු වන ඉගැන්වීමක් ලෙස ආචාර්යවරයා යනු කවරෙක් ද යන්න විවරණය වී ඇති නිද්දෙස අට්ඨකතා විවරණයෙන් පැහැදිලි වෙයි. එහි දී ආචාර්යවරයා කරුණු 5කින් යුක්ත විය යුතු බව උගන්වා ඇත.

1. ප්‍රිය මනාප බව
2. වචනයෙහි දක්ෂ බව
3. පදාර්ථයන් දන්නා බව
4. ගැඹුරු ලෙස කතා කිරීම
5. මසුරු නොවීම (නිද්දේස අට්ඨකතාව, 124 පිටුව).

මෙම විස්තරයෙන් අනාවරණය වන්නේ ද ආචාර්යවරයෙකු වීමට නම් වචනයෙහි දක්ෂ විය යුතු බව හා පදාර්ථයන් දන්නා බව වැදගත් වන බව යි.

අසන්නා හෙවත් ශිෂ්‍යයා ද කරුණු පහකින් යුක්ත විය යුතු ය. එනම්,

1. දේශනාවට පරිභව නො කරයි.

2. දේශනා කරන ලද ධර්මයට පරිභව නො කරයි.

3. තමාට පරිභව නො කරයි.

4. නොවිසිරුණු සිතින් ධර්මය ශ්‍රවණය කිරීම

5. එකඟ වූ සිතින් ධර්මය මෙනෙහි කිරීම (නිද්දේස අට්ඨකථා, 126 පිටුව).

ශිෂ්‍යයෙකු සතු ගුණවත්කම් ඉස්මතු වන්නේ ද වචනය මූලික කොටගෙන බව මෙයින් පැහැදිලි වේ. එසේ ම ඉගෙන ගැනීම යනු නිශ්ශබ්ද ව හිඳ ප්‍රගුණ කිරීම යි. පසු ව එය පදයෙන් පදය අර්ථ ගළපා වචනයෙන් වචනය පුරුදු කළ යුතු ය. එය ''පරියාපුණාති'' යනුවෙන් හැඳින්වේ.

වචන භාවිත කිරීමේ දී අන්‍ය මතවාදවලට සවන්දීම වැදගත් වෙයි. තමාගේ වචන නිවැරදි ව පිළිවෙළට භාවිත කළ හැක්කේ එවිට ය. එසේ ම සත්‍ය පදනම් කොටගෙන පමණක් වචන භාවිත කළ යුතු ය. කනට මිහිරි වදන් භාවිතය බුදුසමය අගය කරයි. ''ඵරුසං වාචං පහාය ඵරුසා වාචාය පටිවිරතො හොති'' යා සා වාචා නෙලා කණ්ණසුඛා, පෙමනීයා, හදයංගමා පොරී බහුජන කන්තා, බහුජන මනාපා, තථාරූපි වාචං ගොසිතා හොති'' (දීඝනිකාය 1, 8 පිටුව).

ආදි ලෙසින් වචනයේ භාවිතය පැහැදිලි කර ඇත. ඒ අනුව වචන භාවිත කිරීමේ දී නෙළා මිහිරි විය යුතු ය. කණ්ණසුඛ යනු කනට සැපගෙන දෙන, පෙමනීයා ප්‍රේමනීය වූ, හදයංගමා වචා, හදවතට සැපදායක විය යුත්තක් ම කතා කළ යුතු ය. පොරි යනු විශිෂ්ට සම්පත් වීම යි. බහුජන කන්තා බොහෝ ජනයාට යහපත ගෙන දෙන වචන භාවිතය සම්බන්ධ ඉතා වැදගත් ඉගැන්වීමක් අංගුත්තර නිකායේ ආඝාත පටිවිනය සූත්‍රයේ දැක්වේ. සමාජයේ සිටින පුද්ගලයන් පස් දෙනෙකු පිළිබඳ තොරතුරු ඇතුළත් වී තිබේ (අංගුත්තරනිකාය 2, 162 පිටුව).

1. ක්‍රියාව අයහපත් වචනය යහපත් පුද්ගලයා (අපරිසුද්ධ කාය සමාචාරො හොති පරිසුද්ධ වචී සමාචාරො (අංගුත්තරනිකාය 3 304පි).

2. වචනය අයහපත් ක්‍රියාව යහපත් පුද්ගලයා (අපරිසුද්ධ වචීසමාචාරො හොති පරිසුද්ධ කාය සමාචාරො)

3. ක්‍රියාවත් වචනයත් අයහපත් පුද්ගලයා (අපරිසුද්ධ කායසමාචාරො හොති අපරිසුද්ධ වචී සමාචාරො

4. ක්‍රියාවත් වචනයත් අයහපත් මනසේ දියුණුවක් නැති (අපරිසුද්ධ කාය සමාචාරො හොති අපරිසුද්ධ වචීසමාචාරො ච චලභති කාලීන කාලං චෙතසො)

5. ක්‍රියාවත් යහපත් වචනයත් යහපත් කලින් කල සිතේ දියුණුව ඇති පුද්ගලයා (පරිසුද්ධකාය සමාචාරො පරිසුද්ධ වචී සමාචාරො ලභති ච කාලෙන වා කාලං චෙතසො (අංගුත්තරනිකාය 3, 304පි).

මෙහි පළමු වැනි පුද්ගලයාගේ ස්වභාවය නම් ඔහුගේ වචන ඉතා යහපත් වීම යි. එහෙත් ඔහුගේ ක්‍රියාවන් යහපත් නො වේ. මෙවැනි පුද්ගලයෙකු කෙරෙහි සිතේ ක්‍රෝධයක් හට නොගැනීමට ඔහුගේ අයහපත් ක්‍රියාවන් මෙනෙහි නොකොට ඔහුගේ යහපත් වදන පිළිබඳ ව සිහි කළ යුතු ය.

මෙහි සඳහන් වන දෙවන පුද්ගලයා පිළිපැදිය යුතු ආකාරය දක්වන්නේ මෙසේ ය. ''ඉතාමත් පිපාසිත පුද්ගලයෙකු ජලය සොයා අවිදිනුයේ සෙවෙල සහිත පොකුණක් දැක එහි බැස එහි සෙවෙල් පරඬල් එහා මෙහා කොට ජලය පානය කොට පිපාසය සංසිඳුවා ගනී ද? එලෙස වාචසික පාරිශුද්ධත්වය රහිත කෙනාගේ ඒ

ස්වභාවය සිහි නොකොට ඔහු තුළ පවතින කායික පාරිශුද්ධත්වය පිළිබඳ පමණක් මෙනෙහි කළ යුතු ය.

තෙවන පුද්ගලයාගේ ස්වභාවය නම් කායික හා වාචසික යන උභය පාරිශුද්ධත්වයෙන් ම තොර වීම යි. එහෙත් යම් අවස්ථාවල සිතේ යම් ප්‍රසාදයක් ප්‍රකට විය හැකි ය. එවැනි පුද්ගලයෙකුගේ කායික හෝ වාචසික අපරිශුද්ධත්වය සිහි කළහොත් එයින් තමාගේ සන්තානය දූෂිත වේ. එම නිසා ඔහු තුළ හටගන්නා වූ සිතේ ප්‍රසාදය පිළිබඳ පමණක් මෙනෙහි කළ යුතු ය.

මෙහි කියවෙන සතරවන පුද්ගලයා වාචසික හෝ කායික පාරිශුද්ධියක් නොමැති සිතෙහි ද යම් ප්‍රසාදයක් නොමැත්තා ය. මෙවැනි පුද්ගලයන් පිළිබඳ කෝපය දුරුකළ යුතු ආකාරය ද මෙහි දක්වා ඇත.

මෙහි සඳහන් පස්වන පුද්ගලයා කායික හා වාචසික පාරිශුද්ධත්වයෙන් හෙබි සිතෙහි දියුණුව ද පවතින පුද්ගලයා ය. මේ අනුව වචන භාවිත කිරීම සම්බන්ධ ව ආඝාත පටිවිනය සූත්‍රයේ දක්වා ඇති කරුණු වැදගත් වේ.

මේ ආකාරයට වචන භාවිත කළ යුතු ආකාරය සූත්‍ර ධර්මවල මැනවින් විග්‍රහ වී ඇත.

### සමාලෝචනය

ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායේ වචනය ඉතා වැදගත් වූවකි. පැවිදි ජීවිතයේ විවිධ ස්ථරවල ද ආරාමික ජීවිතයේ ද මෙම වචන භාවිත වෙයි. එබැවින් සෑම අවස්ථාවක දී ම සත්‍ය වූත් යහපත ගෙනදෙන්නා වූත් වචන ම භාවිත කළ යුතු ය. අසත්‍ය හෝ නිවැරදි නොවන වදන් කිසිවිටෙකත් භාවිත නොකළ යුතු ය. ප්‍රාණය හා සමාන ව නිවැරදි යහපත් වචන ම නිරන්තරයෙන් උපයෝගි කරගත යුතු ය.

### මූලාශ්‍රය

#### ප්‍රාථමික මූලාශ්‍රය

*අංගුත්තරනිකාය 3*, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝනිකාය 1*, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ධම්මපදපාළි* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*නිද්දෙසපාළි අට්ඨකථා 2*, (2007). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිමනිකාය 1*, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිමනිකාය 2*, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

#### ද්විතීයික මූලාශ්‍රය

අබේනායක, ඕ, (2009). *පාලි අධ්‍යයන විමර්ශන*, මරදාන: සංස්, මහමිතව, පඤ්ඤාරතන හිමි, පහලගම ධම්මික හිමි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

අරියවිමල හිමි, කේ, (2011). *විවරණ*, කොළඹ, සංස්, මහමිතව, පඤ්ඤාරතන හිමි, රත්මල්වැටියේ සමිත හිමි, තල්දූව: පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය.

තිලකරත්න, ඒ, (2020). *බෞද්ධ ආචාරවිද්‍යාව*, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

මේධානන්ද හිමි, ඩී, (2009). *භික්ෂු සමාජය*, මරදාන: දයාවංශ ජයකොඩි සහ සමාගම.